# මහ බැංකුවෙන් පැහැදිලි කිරීමක්

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා විසින් 'මුදල් මණ්ඩල සාමාජිකයන් සිය අමාත්‍යාංශයට කැඳවා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සභාවේ අවිධිමත් ගෙවීම් පිවිසුම ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දුන්' බවට ප්‍රවෘත්තියක් මෑතකදී පළ විය. එය කිසිදු පදනමක් නැති අසත්‍ය ප්‍රවෘත්තියකි.

රාජ්‍ය අමාත්‍යවරයා ජාතික ගෙවීම් පද්ධතියට අදාළව දිගු කලක් තිස්සේ පැවැති ගැටළුවක් විසඳාලීම උදෙසා ඊට අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාවක් කැඳවන ලදී. ආර්ථිකයේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය සම්බන්ධව එම සාකාච්ඡාව බෙහෙවින් වැදගත් විය.

දිගුකල් පැවති මේ ගැටළුව විසඳා ගැනීමට සහාය වීමේ අරමුණින් මුදල් මණ්ඩලයේ ස්වාධීන සාමාජිකයෝ දෙදෙනෙක් මෙම සාකච්ඡාවට සහභාගී වීමට ස්වේච්ඡාවෙන්ම කැමැත්ත පළ කළහ.

රාජ්‍ය අමාත්‍ය හර්ෂ ද සිල්වා මහතා විසින් කැඳවන ලදුව එතුමාගේම ප්‍රධානත්වයෙන් පැවති මෙම සාකච්ඡාවේදී අදාළ ගැටළුව විසඳීම සම්බන්ධ එකඟතාවක් ඇති වී තිබේ.

**අධ්‍යක්ෂ, සන්නිවේදන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහා බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.**
**011 - 2 477418 @ dcommunications@cbsl.lk www.cbsl.gov.lk**